**නවගත්තේගම ප්‍රාදේශීය සභාව**
**පුත්තලම දිස්ත්‍රික්කය**

**1.** **මූල්‍ය ප්‍රකාශන**

**1.1** **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

**2018** වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන **2019** පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර**,** එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව **2019** මැයි **30** දිනද, විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 ජුනි 26 දිනද සභාපතිවරයාට යවා ඇත.

**1.2** **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට නවගත්තේගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3** **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**(අ)** **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**(i) ලැබිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් 19ක ශේෂ එකතුව රු.11,083,841 ක් වූ අතර, ඉන් වර්ෂ 05 ක කාලයක් ඉක්මවූ ශේෂ එකතුව රු.95,055 ක් විය. | ලැබිය යුතු ගිණුම් ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | දොරින් දොරට ගමින් ගමට 2014 ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කළ කර්මාන්ත 8 කට අදාළව තව දුරටත් ලැබිය යුතුව පවතින රු. 95,055 අය කර ගැනීමට අදාළව ලිඛිත ඉල්ලීම් කර ඇති බව කාරුණිකව දන්වමි. |

**(ii) ගෙවිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව තිබූ ගිණුම් 09 ක ශේෂවල එකතුව රු.3,698,610ක් වූ අතර, එයින් වසර 04 ක් ඉක්මවූ ණයහිමියන් රු.80,005 ක් විය. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කළ යුතු වේ. | 2014 වර්ෂයේ දී ක්‍රියාත්මක කරන ලද දොරින් දොරට ගමින් ගමට ව්‍යාපෘතිය යටතේ වූ කර්මාන්ත වෙනුවෙන් ගෙවිය යුතු රු.95,082 ක වටිනාකම ගෙවීමට නොහැකි වූයේ ඒ සඳහා ප්‍රතිපාදන නොලැබීම නිසා බව කාරුණිකව දන්වමි. |

**(ආ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එකතු වටිනාකම රු.45,837,369 ක් වූ ගිණුම් විෂයයන් 02 කට අදාලව සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අදාළ සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | ලී බඩු සවිකිරීම් පිළිබඳ ලේඛනයක් නොපැවති බැවින් ඒ සඳහා ලේඛනයක් සකස් කිරීමට පියවර ගන්නා බව කාරුණිකව දන්වමි. |

## 1.4 අනුකූල නොවීම්

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| 1988 ප්‍රාදේශීය සභා(මූල්‍ය හා පරිපාලන) රීති | | | | |
| (i) | අංක 5 (3) රීතිය | ආදායම් එක් රැස්කිරීම සම්බන්ධයෙන් අභ්‍යන්තර පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. | අභ්‍යන්තර විගණනය සිදු කළ යුතු වේ. | 2019 වර්ෂයේ දී එය නිවැරදිව සිදු කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ii) | අංක 5 (7) රීතිය | මූල්‍ය හා ගබඩා කටයුතු සම්බන්ධයෙන් සම්පූර්ණ | අභ්‍යන්තර විගණනය සිදු කළ යුතු වේ. | මූල්‍ය හා ගබඩා කටයුතු සම්බන්ධයෙන් සම්පූර්ණ |

| | |
|---|---|
| කාලපරිච්ඡේදය ආවරණය වන පරිදි අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | කාල පරිච්ඡේදය ආවරණය වන ලෙස අභ්‍යන්තර විගණනය ක්‍රියාත්මක කළ නොහැකි විය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු.1,753,151ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,415,682ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කල ආදායම් , රැස්කල ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | 2018 දෙසැම්බර් 31 දිනට හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | 2017 දෙසැම්බර් 31 දිනට හිඟය |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| වරිපනම් බදු | 386 | 488 | 467 | 21 | 314 | 414 | 420 | - |
| කුලී | 1,699 | 4,052 | 4,031 | 22 | 1,699 | 1,317 | 1,317 | - |
| බලපත්‍ර ගාස්තු | 149 | 208 | 208 | - | 89 | 149 | 149 | - |
| වෙනත් ආදායම් | 3,188 | 2,312 | 1,059 | 1,253 | 3,188 | 1,063 | 1,063 | - |
| එකතුවරැ ස් | 5,422 | 7,060 | 5,765 | 1,296 | 5,290 | 2,943 | 2,949 | - |

කළ ආදායම තුල සමාලෝචිත වර්ෂයට බිල් කළ ආදායමෙන් කළ එකතු කිරීම් සහ පසුගිය වර්ෂවල හිඟ ආදායමෙන් කළ එකතු කිරීම් ඇතුළත්ව තිබේ.

**2.2.2** ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

-----------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට මුළු බිල්කළ ආදායම රු.7,060,631ක් වූ අතර වර්ෂය තුලදී බිල්කළ ආදායමෙන් රු.5,765,131ක් රැස්කර තිබුණි. ඒ අනුව වර්ෂය තුල සමස්ත ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය සියයට 82 ක් පමණ විය. | හිඟ ආදායම් අයකර ගැනීම කඩිනම් කළ යුතු වේ. | අදහස් දක්වා නොතිබුණි. |

**03.** මෙහෙයුම් සමාලෝචනය

---------------------------

**3.1** කාර්ය සාධනය

------------------

ප්‍රාදේශීය සභා පනතේ 03 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මං මාවත් පිළිබඳ කරුණු විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබ විහරණය පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

--------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2018 දෙසැම්බර් 31 දින වන විටත් කරුණු 15 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. | සියළුම ප්‍රධාන කාරණා සඳහා අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොතිබුණි. |

(ආ) ප්‍රතිපාදන නොසැළසීම

-----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පිළියෙල කර තිබුණු වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු ඇස්තමේන්තු අගය රු.27,700,000 ක් වූ කාර්යයන් 08 ක් සඳහා වාර්ෂික අයවැය මගින් ප්‍රතිපාදන සලසා නොතිබීම නිසා එම කාර්යයන් ඉටුකළ නොහැකි වී තිබුණි. | ක්‍රියාකාරී සැලැස්මට අනුව අයවැය මගින් ප්‍රතිපාදන සළසා ගත යුතු වේ. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කළද එම ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන සලසා ගැනීමට නොහැකි වූ බව කාරුණිකව දන්වමි. මධ්‍යම රජයෙන් සහ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන 2018 වර්ෂය තුළ අපේක්ෂිත පරිදි නොලැබුණ බව සඳහන් කරමි. |

**(ඇ) ඉටු නොකළ කාර්යයන්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වාර්ෂික අයවැය මගින් රු.499,000 ක ප්‍රතිපාදන සළසා තිබුණු කර්තව්‍යයන් 10 ක් වර්ෂය තුල ඉටුකර නොතිබුණි. | ප්‍රතිපාදන මුදල් කාර්යක්ෂමව හා ඵලදායීව යෙදවිය යුතු වේ. | කුඩා දොඩම් අත්තැව ජල ව්‍යාපෘතිය සහ සතිපොළ භූමිය සකස් කිරීම යන ව්‍යාපෘති සඳහා අරමුදලේ මූල්‍ය තත්ත්වය ප්‍රමාණවත් නොවීම නිසා ක්‍රියාත්මක කළ නොහැකි විය. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් නවගත්තේගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ජලභීතිකා මර්ධන වැඩසටහන 2018 වර්ෂය තුළ ක්‍රියාත්මක නොකළ බැවින් වැය දැරීමට නොහැකි විය. අනෙකුත් වැඩසටහන් 2018 වර්ෂය තුළ ක්‍රියාත්මක කල නොහැකි වූ බව පිළිගනිමි. |

**(ඈ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කසළ කළමනාකරණ ක්‍රියාවලියක් ආරම්භ නොකර නගරයේ එක්රැස් කරන කසළ විවෘත භූමියකට බැහැර කිරීම පමණක් සිදුකර තිබුණි. | විධිමත් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ පිළිවෙලක් ආරම්භ කර ක්‍රියාත්මක කළ යුතු වේ. | මේ වන විට ඝන අපද්‍රව්‍ය වෙන් කර රැස් කිරීම සිදු කරනු ලබන අතර දිරන කසළ පෞද්ගලික ගැනුම්කරුවෙකුට ලබා දෙන බව සඳහන් කරමි. නොදිරන කසළවලින් කොටසක් වෙනත් පෞද්ගලික ගැනුම්කරුවෙකුට ලබා දෙනු ලබයි. ශේෂ වන අපද්‍රව්‍ය පමණක් බිම් පිරවුමක් සඳහා යොමු කරනු ලබන බව කාරුණිකව දන්වමි. |

**(ඉ) තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක**

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" ප්‍රකාරව ළඟා කරගත යුතු අරමුණු හා ඉලක්ක කරා ළඟාවීමට සූදානම පිළිබඳ පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සභාව විසින් තිරසර සංවර්ධන අරමුණු 06 ක් සඳහා ඉලක්කයන් 22ක් හඳුනාගෙන එම අරමුණු හා ඉලක්ක ළඟා කරගැනීමේ ක්‍රියාකාරකම් රාශියක් ක්‍රියාත්මක කිරීමට සැළසුම් කර තිබුණි. | තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීමට අවශ්‍ය ඉලක්ක කරා ළඟා විය යුතු වේ. | අදහස් දක්වා නොතිබුණි. |
| (ii) | සමාලෝචිත වර්ෂය තුල බල ප්‍රදේශයේ වීථි පහන් වලින් සියයට 50 ක් සූර්යාලෝකයෙන් ආලෝකය උපදවන වීථි පහන් බවට පත් කිරීම හා මහජන පුස්තකාලය සඳහා අන්තර්ජාල පහසුකම් ලබාගැනීම යන ඉලක්ක ක්‍රියාත්මක කිරීමට සැළසුම් කර තිබුණු නමුත් ආරම්භ කර නොතිබුණි. | සූර්යාලෝකයෙන් ආලෝකය උපදවන වීථි පහන් බවට පත්කිරීම හා මහජන පුස්තකාලය සඳහා අන්තර්ජාල පහසුකම් ලබාගැනීමට කටයුතු කල යුතුවේ. | බල ප්‍රදේශයේ වීථි පහන්වලින් 50% ක් සූර්යාලෝකයෙන් අලෝකය උපදවන විථි පහන් බවට පත් කිරීම අවසන් කිරීමට අපේක්ෂා කරන්නේ 2030 වන විටදීය. මහජන පුස්තකාලය සඳහා අන්තර්ජාල පහසුකම් ලබා ගැනීමට අපේක්ෂා කරන්නේ වසර 2020 දීය. |

## 3.2 කළමනාකරණ කාර්යක්ෂමතා

----------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාව විසින් වර්ෂය තුල ආදායම් ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමක් හෝ නව ආදායම් උත්පාදන මාර්ග කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි | නව ආදායම් උත්පාදන මාර්ග කෙරෙහි අවධානය යොමු කළ යුතු වේ. | 2016 වර්ෂය අවසන් වන විට නවගත්තේගම නාගරික ප්‍රදේශය තුළ වරිපනම් ප්‍රදේශයක් ලෙස තක්සේරු කිරීමට සැලසුම් කර ඇත. එහි සමීක්ෂණ වාර්තා මේ වන විට තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති බව කාරුණිකව දන්වමි. |
| (ආ) | පොදු වෙළඳ සංකීර්ණයේ ඉහළ මහලේ සහ බස් නැවතුම්පල ඉහළ මහලේ ඉදිකිරීම් කටයුතු 2017 වර්ෂයේ නිමකර ඇතත් 2018 වර්ෂයේදී විදුලිය ලබාගැනීමට කටයුතු නොකිරීම නිසා ගොඩනැගිලි බදු දීමට නොහැකිවී තිබුණි. | අදාල ඉදිකිරීම් කටයුතු සිදුකර ගොඩනැගිලි බදු දීමට කටයුතු කළ යුතු වේ. | බස්නැවතුම්පල ඉහළ මාලයට මේ වනවිට විදුලි සම්බන්ධතාවය ලබාගෙන ඇති අතර එය බදු දීම සඳහා ටෙන්ඩර් කැඳවීමට කටයුතු කරමින් පවතී. පොදු වෙළඳ සංකීර්ණයේ ඉහළ මාලය සඳහා විදුලි සම්බන්ධතාවය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කරමින් පවතින බව කාරුණිකව දන්වමි. |
| (ඇ) | 2016 ජූනි 14 දින ජනතා අයිතියට පත්කර තිබූ නවගත්තේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ඉඩමක ඉදිකළ නවගත්තේගම රංග ශාලා | අදාල වත්කම කඩිනමින් පවරා ගැනීමට කටයුතු කර භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුවේ. | නවගත්තේගම රංගශාලා ගොඩනැගිල්ල නවගත්තේගම ප්‍රාදේශීය සභාවට පැවරීමේ කටයුතු සිදු කරමින් පවතින බව නවගත්තේගම ප්‍රාදේශීය ලේකම්තුමා |

| | | |
|---|---|---|
| ගොඩනැගිල්ල සඳහා සභා අරමුදලින් රු.300,204ක් වියදම් කර තිබුණද 2019 මාර්තු මාසය වන විටත් එකී රංග ශාලාව නවගත්තේගම ප්‍රාදේශීය සභාව වෙත පවරාගැනීමට කටයුතු කර නොතිබුණි. | | විසින් ලිඛිතව දන්වා ඇත. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පුරප්පාඩුවී ඇති ලේකම් තනතුර සම්පූර්ණ කර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණු අතර ද්විතියික ශ්‍රේණියට අයත් පුස්තකාලාධිපති, කළමනාකරණ සහකාර, සංවර්ධන නිලධාරී තනතුරු 01 බැගින් හා ප්‍රාථමික ශ්‍රේණියට අයත් නල ළිං කාර්මික, විදුලි කාර්මික තනතුරු 01 බැගින් පුරප්පාඩුව පවතී. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අදහස් දක්වා නොතිබුණි. |

**3.4 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නවගත්තේගම ප්‍රාදේශීය සභාව හා වර්ල්ඩ් විෂන් ලංකා ආයතනයේ මූල්‍ය දායකත්වයෙන් ඉදිකර 2014 අප්‍රේල් 23 දින සිට ක්‍රියාත්මක වන සෞඛ්‍ය ආරක්ෂිත විද්‍යුත් ජල පිරිපහදු යන්ත්‍රාගාරයේ භාවිතා කළ රු.1,163,600ක උපකරණද අක්‍රීය තත්වයේ පැවතුණි. එසේම රු.325,000ක් වූ වත්කම් දෙකක්ද වර්ෂ ගණනාවක සිට නිශ්ක්‍රීයව පවතී. | සුදුසු වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතු වේ. | මෙය 2014 වර්ෂයේ ආරම්භ කර ක්‍රියාත්මක කළ ව්‍යාපෘතියකි. 2018 වර්ෂය තුළ රජය විසින් RO ජල ෆිල්ටර් තාක්ෂණය හඳුන්වා දීම සහ පෞද්ගලික අංශය විසින් RO ජල පෙරණ සවිකර ජලය බෙදා හැරීමට පටන් ගත් නිසා ප්‍රාදේශීය සභාවේ ජල පිරිපහදුවේ ඉල්ලුම අඩුවී ආදායම සීඝ්‍රයෙන් පහළ ගිය අතර ව්‍යාපෘතියට ජලය ලබා ගත් ප්‍රජා මූල ජල සම්පාදන ජල ඒකකයේ ජලය අධික ලවණතාවයෙන් යුක්ත වීම නිසා සවිකර තිබූ යන්ත්‍ර අක්‍රීය විය. මෙම යන්ත්‍ර වෙන්දේසි කිරීමට කටයුතු කරමින් පවතී. |

**3.5 වාහන උපයෝජනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වාහන 03 ක් 2018 වර්ෂයේදී අනතුරට ලක්වී ඒ සඳහා රක්ෂණ වන්දි ලබාගෙන තිබූ නමුත් ඒවා සම්බන්ධයෙන් මු.රෙ.104 ප්‍රකාර හානි වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | අදාල වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වේ. | 2018 වර්ෂය තුළ දී වාහන 03 ක් අනතුරට ලක් වූ අතර එහි අලාභය රු.53,700 ක් විය. මෙම වාහන අනතුරු සිදු වී ඇත්තේ රියදුරුට පාලනය කර ගත නොහැකි හේතු මත බැවින් එම අලාභයන් රක්‍ෂණ ආයතනයෙන් රු.49,740 ක් ආවරණය කර ගන්නා ලදි. |

**3.6 කොන්ත්‍රාත් පරිපාලනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| නවගත්තේගම බස් නැවතුම්පල වෙළඳ සංකීර්ණය නවීකරණය කිරීම 2017 යටතේ වූ ප්‍රතිපාදන මත බස් නැවතුම්පල භූමියේ කඩ කාමර සංකීර්ණය 2017 ඔක්තෝබර් 13 සිට 2017 දෙසැම්බර් 28 කාලය තුල නිමකළ යුතු වුවත් එසේ ගිවිසුම් ප්‍රකාරව වැඩ නොකළ වැඩ විෂයයන් කිහිපයක් පමණක් අවසන් කර ඒ සඳහා පමණක් ගෙවීම් කර තිබුණි. සාදා නිම කළ කොටස් ඵලදායී ලෙස යොදාගැනීමේ තත්ත්වයට පත්ව නොතිබුණි. | ප්‍රතිපාදන සොයාගෙන අදාල කාර්යය නිම කල යුතු වේ. | නවගත්තේගම බස් නැවතුම්පල වෙළඳ සංකීර්ණයේ ඉතිරි වැඩ නිම කර ගැනීම සඳහා රේඛිය අමාත්‍යාංශයෙන් ප්‍රතිපාදන ඉල්ලා යෝජනාවක් ඉදිරිපත් කර ඇත. 2018 වර්ෂය තුළ ඒ සඳහා ප්‍රතිපාදන නොලැබුණි. |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය තුල අයවැය විෂයයන් 29 ක ඇස්තමේන්තුගත වෙන්කිරීම් සියයට සියයක් ඉතිරිව තිබුණි. | ඉලක්ක සපුරා ගතහැකි අයවැය ලේඛනයක් පිළියෙල කළ යුතු වේ. | අදහස් දක්වා නොතිබුණි. |

## 4.2 අභ්‍යන්තර විගණනය

-----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අභ්‍යන්තර විගණන සැලැස්මක් සකස් කර තිබූ අතර, 2018 වර්ෂයේ අවසන් අර්ධ වර්ෂය සඳහා විගණන කටයුතු සිදුකර වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වේ. | 2018 දෙවන අර්ධ වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනය සැලසුම් ප්‍රකාරව සිදු කිරීමට නොහැකි විය. 2019 වර්ෂය තුළ අභ්‍යන්තර විගණනය නිසි පරිදි සිදු කරන බව කාරුණිකව දන්වමි. |